# <u>ශ්‍රී ලංකා වරාය අධිකාරිය.</u>

මගේ අංකය : මාසකො/කාතානො/පුරප්පාඩු/2026

## <u>දැන්වීමයි.</u>

පහත සඳහන් තනතුර සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති මෙම අධිකාරියේ ස්ථිර සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් වරායන් හා එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

**ජොෂ්ඨ ටග් සේලර් - Senior Tug Sailor - (පුරප්පාඩු - කොළඹ - 25 , ගාල්ල - 02, ත්‍රි'මලය - 04)**

**සේවා ගණය - ශිල්පීය තාක්ෂණ (ST)**

| | | | | |
|---|---|---|---|---|
| **<u>වැටුප් කාණ්ඩය :</u>** | **9 : 3 (ST3)** | ආරම්භක වැටුප | : | රු. 40240/= |
| | | වාර්ෂික වේතනාධිකය | : | රු. 575 /= |

දැනටමත් ඉහළ වැටුප් කාණ්ඩයක පිහිටුවා ඇති අයදුම්කරුවන් මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට සිටින වැටුප් කාණ්ඩය සැලකිල්ලට ගෙන 9 : 1 (ST1) හෝ 9 : 2 (ST2) කාණ්ඩයේ පිහිටුවීම සලකා බලනු ලැබේ.

**<u>සුදුසුකම් :</u>**

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත් වීම.

සමඟ

පළපුරුද්ද
ටග් සේලර් තනතුරේ වසර තුන (03) ක සක්‍රීය පළපුරුද්ද

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

සමඟ

පළපුරුද්ද
ටග් සේලර් තනතුරේ වසර පහ (05) ක සක්‍රීය පළපුරුද්ද

**අනෙකුත් අනිවාර්යය අවශ්‍යතා**

i. ගිනි නිවීම හා ගිනි වැළැක්වීම පිළිබඳ සහතිකය
ii. සාමාන්‍ය ආරක්ෂාව - ප්‍රථමාධාර පිළිබඳ සහතිකය
iii. පුද්ගල ආරක්ෂක ශිල්ප ක්‍රම පිළිබඳ සහතිකය
iv. වැඩබිමේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ සහතිකය

**වෙනත් - සියළුම තනතුරු වලට අදාළ වේ**

i. පසුගිය ආසන්න වසර තුන (03) ක කාර්යසාධනය සතුටුදායක විය යුතුය.

ii. අ.පො.ස. (සා.පෙළ) විභාගය අසමත් අයදුම්කරුවන් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් පවත්වනු ලබන වරාය කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව හදාරා තිබිය යුතුය.

iii. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ වෘත්තිය පළපුරුද්ද පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් (සම්මුඛ හා ප්‍රායෝගික) සමත් විය යුතුය.

iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

2 වන පිටුවට

v. ආරක්ෂක නියාමක තනතුරට බඳවා ගෙන ඇති සේවකයින් මෙම තනතුරට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ වරාය ආරක්ෂක සේවයේ වසර පහ (05) කට වැඩි සේවා කාලයක් සපුරා ඇත්නම් පමණි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියළුම නීතිරීති වලට අනුකූලව පත්වීම් ලබන්නා ක්‍රියා කළ යුතුය.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍යවන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ වරායක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක / අංශයක සේවය කිරීමට බැඳීසිටී.

රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමෙහිලා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියළුම නීති රීතිවලට අනුකූලව පත්වීම් ලබන්නා ක්‍රියා කළ යුතු වේ.

මෙම නිවේදනය අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අයදුම්පත් මාසකො/ආකෘති/01/2026 දරණ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කොට අදාළ කොට්ඨාශ/අංශ ප්‍රධානීන් මගින් **2026.10.05** වන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත සමඟ තනතුරට අදාළ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු අතර එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ/අංශ ප්‍රධානීන් හෝ නේවාසික කළමනාකරු විසින් හෝ සඳහන් කළ යුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (මාසකො/ආකෘති/01/2026 අයදුම්පත අදාළ කොට්ඨාශවලින් හා මානව සම්පත් කොට්ඨාශයේ සේවා මධ්‍යස්ථානයෙන් ලබා ගත හැක.)

මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)

2026.09.17 වන දින
මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය.